**ලංකා විදුලිබල මණ්ඩලය - 2016**

**-------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ ("ලංවිම") මූල්‍ය ප්‍රකාශන හා ලංකා විදුලිබල මණ්ඩලයේ හා එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ("සමූහය") 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම හැර අනෙකුත් පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරි සමාගම් විසින් විගණනය කරන ලද අතර සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන මා විසින් විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර/ ශ්‍රීලංමූවාප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2 මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

**2.1 මතය**

**-------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලින් හා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**-------------------------------------------**

**2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**-------------------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත සඳහන් කරුණ පදනම් කරගෙන සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමෙහි විගණක විසින් එහි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.
අත්හැර දමා ඇති සාම්පූර් ගල් අඟුරු විදුලිබල පිරියත ව්‍යාපෘතියට අදාළව කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ රු.328,109,272 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන දේපල, පිරියත හා උපකරණවල ඇතුළත් කර තිබුණි. ඇතිවිය හැකි හානිකරණය තක්සේරු කිරීම සඳහා කළමනාකරණය විසින් 2016 දෙසැම්බර් 31 දිනට විස්තරාත්මක හානිකරණ තක්සේරුවක් සිදුකර නොතිබුණි.

එයට අමතරව පහත සඳහන් කරුණ අවධාරණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ සාම්පූර් ගල් අඟුරු බලාගාර පිරියතෙහි සංවර්ධන කටයුතු සමාගම විසින් නවතා දමා තිබුණි. එබැවින්, සමාගමේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් ඇති කරන විශාල අවිනිශ්චිතතාවයක් පැවතීම මෙයින් නිරූපනය වේ.

(ආ) පහත සඳහන් කරුණු පදනම් කරගෙන 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් තත්ත්වාගණනය කරන ලද විගණන මතයක් ප්‍රකාශ කරන ලදී.

(i) බදු ගණනය කිරීමේ විස්තර හා බදු වාර්තා ආදී ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් 10 හා 14 යටතේ දැක්වෙන රු.26,506,918 ක්, රු.894,150 ක් හා රු.77,718 ක් වූ පිළිවෙලින් එකතු කළ අගය මත බදු (VAT), ආර්ථික සේවා ගාස්තු (ESC) හා රඳවා ගැනීම් බදුවලට අදාළ ලැබිය යුතු බදු සහ රු.11,703,151, රු.3,371,326 ක් හා රු.12,758,801 ක් වූ පිළිවෙලින් ආදායම් බදු, ජාතිය ගොඩනැගීමේ බදු (NBT) හා එකතු කළ අගය මත බදු (VAT) වලට අදාළව ගෙවිය යුතු බදු සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

එසේම, මූල්‍ය ප්‍රකාශනවල සටහන් - 17 යටතේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස දැක්වෙන එකතුව රු.65,474,540 ක් වූ ආදායම් බදු වගකීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්තාවල දැක්වෙන ශේෂය සමඟ එකඟ නොවුණි. තවද, ගණනය කිරීමේ විස්තර හා බදු වාර්තා ආදී තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම වගකීම පිළිබඳ විශ්වාසවන්තභාවය හා නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ii) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා නැව් සංස්ථාව වෙත ගෙවිය යුතු මුදල රු.170,378,808 ක් වුවද සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් ලැබුණු සනාථ කිරීම්වලට අනුව එය රු.788,958,985 ක් ලෙස දැක්වුණි. එම වාර්තාවන් දෙක අතර රු.618,580,177 ක නොසැසඳුණු වෙනසක් නිරීක්ෂණය විය. එබැවින් එම ශේෂය පිළිබඳ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය.

එයට අමතරව, පහත සඳහන් කරුණ අවධාරණය කෙරේ.

ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) හා සමාගම අතර 2013 සැප්තැම්බර් 05 දින එළඹි ගිවිසුම අනුව, සමාගමේ ප්‍රධාන කාර්යය වන්නේ, ජාත්‍යන්තර වෙළඳපොලෙන් ගල් අඟුරු ප්‍රසම්පාදනය කිරීම (සමාගම එහි නමින් විවෘත කරන ලද ණයවර ලිපි සඳහා ලංකා විදුලිබල මණ්ඩලය ගෙවීම් කරයි) සහ එම ගල් අඟුරු කිසිදු ලාභ ආන්තිකයක් තබා ගැනීමෙන් තොරව ලංකා විදුලිබල මණ්ඩලයට ආපසු විකිණීමයි. තවද සමාගම විසින් උපයන ලද ඕනෑම වෙනත් ආදායමකට එරෙහිව නිරවුල් කිරීමෙන් පසු ඉතිරිව තිබෙන සමාගමේ සියලු මෙහෙයුම් වියදම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරනු ලැබේ. (උදා: සමාගමේ ශුද්ධ පොදුකාර්ය පිරිවැය) කෙසේ වුවද, සමාගමේ ප්‍රධාන කාර්යයෙන් පැන නඟින විකුණුම් ආදායම, විකුණුම් පිරිවැය හා මෙහෙයුම් වියදම් ආදිය සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට සමාගමට නොහැකි වී තිබුණි.

## 2.2.2 ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

### 2.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මූ වා ප්‍ර) හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම

---

(අ) ලංකා විදුලිබල මණ්ඩලය එහි ප්‍රාග්ධනය හා නඩත්තු කාර්යයන් සඳහා දරන ලද ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදුකාර්ය පිරිවැය අගය කිරීම සඳහා තථ්‍ය පිරිවැය වෙනුවට ප්‍රමිත පිරිවැය යොදාගනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, එකතුව රු.5,750,127,816 ක් වූ හිතකර මිල විචලනය සහ ශ්‍රම හා පොදුකාර්ය රේට විචලනයන් සහ රු.3,287,230,903 ක් වූ අහිතකර මිල විචලනය පහත සඳහන් අඩුපාඩුකම් සහිතව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි.

(i) තොග හා කෙරීගෙන යන වැඩ සහ දේපල, පිරියත හා උපකරණ අගය කිරීම සඳහා ප්‍රමිත මිල යොදාගැනීම පිළිවෙලින් ශ්‍රී ලං ගි ප්‍ර 2- තොග හා ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ විධිවිධාන සමඟ අනුකූල වී නොතිබුණි.

(ii) ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළව ඉහළ මූල්‍ය සම්බන්ධය හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම්, වගකීම් හා ස්කන්ධය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වී තිබුණි. කෙසේ වුවද, එම ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළව අවශ්‍ය තොරතුරු නොමැති වීම හේතුවෙන් එයින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 39 - මූල්‍ය උපකරණ, හඳුනාගැනීම හා මිනුම්කරණය :
එකතුව රු.6,970,878,902 ක් වූ සේවක ණයගැතියන් ප්‍රමිතියේ අවශ්‍යතාවය පරිදි සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු මාරු කිරීම් හා දෝෂ
ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථිර ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමෙන් තොරව අතිරේක සාමාන්‍යාධිකාරී (උත්පාදන) විසින් දෙන ලද උපදෙස් පරිදි රු.408,763,137 ක් හා රු.440,056,229 ක් වටිනා අමතර කොටස් පිළිවෙලින් මෙහෙයුම් වියදම් හා ප්‍රාග්ධන වියදම් ලෙස මණ්ඩලය විසින් ගිණුම්ගත කර තිබුණි. එබැවින්, එවැනි වර්ගීකරණයක් සඳහා යොදාගත් පදනම පිළිබඳ සාධාරණත්වය විගණනයේදී පිළිගැනීමට නොහැකි විය. තවද, වර්ගීකරණය සඳහා යොදාගන්නා ලද පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ලක් විජය විදුලි බලාගාරයට අදාළව රු.1,525,188,997 ක් වූ 2014 වර්ෂයේ හා 2015 වර්ෂයේ මෙහෙයුම් හා නඩත්තු වියදම් මූල්‍ය ප්‍රකාශනවල නැවත දක්වනු වෙනුවට සමාලෝචිත වර්ෂය සඳහා වියදම ලෙස මණ්ඩලය විසින් වාර්තා කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල මඟින් කරන ලද රු.403,717,966 ක් වූ ආයෝජන හා රු.51,399,687 ක් වූ ඒ සඳහා පොලිය, එම මූල්‍ය උපකරණවල නොපැවැත්ම හේතුවෙන් අයකර ගැනීම සැකසහිතය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් කිසිඳු ගැලපීමක් හෝ ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ඇ) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට අයත් මෝටර් වාහන 06 ක් ලංකා විදුලිබල මණ්ඩලයේ දේපල ලෙස ගිණුම්ගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දේපල, පිරියත හා උපකරණ (PPF) හා ඒ මත ක්ෂය පිළිවෙලින් රු.46,884,422 කින් හා රු.6,697,775 කින් වැඩියෙන් දක්වා තිබුණි. එබැවින්, 2016 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ සහ සමාලෝචිත වර්ෂය සඳහා පාඩුව පිළිවෙලින් එම මුදල් වලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) එවකට රේඛීය අමාත්‍යාංශය වූ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයට මුදාහැර තිබූ පිරිවැය රු.3,542,566 ක් වූ මෝටර් වාහන 10 ක් වර්ෂ කිහිපයකට පෙර සිට අස්ථානගත වී තිබුණි. එසේ වුවද, කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව එම මෝටර් වාහන ලංකා විදුලිබල මණ්ඩලයේ ගිණුම් පොත්වල පැවතුණි.

(ඉ) රු.223,211,703 ක හර ශේෂයක් (තොග ඌනතාවය) හා රු.18,143,015 ක බැර ශේෂයක් (තොග අතිරික්තය) නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ 1 කට වැඩි කාලයක් තොග ගැලපීම් ගිණුමේ පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ජංගම වත්කම් රු.205,068,688 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) රු.224,554,623 ක් වූ විදේශ භාණ්ඩ ඇණවුමකට අදාළව කොමිස්, නිශ්කාෂණ ගාස්තු ආදී වියදම්, අදාළ වියදම් හෝ වත්කම් ගිණුම්වලට අවශෝෂණය කිරීමෙන් තොරව වර්ෂ 1 කට වැඩි කාලයක් ලක් විජය විදුලි බලාගාර මාර්ගස්ථ - තොග ගිණුමේ පැවතුණි.

**2.2.2.3 නොසැසඳූ වෙනස්කම්**

**-----------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.12,434,413,663 ක ගෙවිය යුතු ශේෂය හා ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ (CPC) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.13,223,722,007 ක් වූ ලැබිය යුතු අනුරූපී ශේෂය අතර රු.789,308,344 ක වෙනසක් නිරීක්ෂණය විය.

ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති විසින් මේ සම්බන්ධයෙන් පහත පරිදි වාර්තා කර තිබුණි. "2013 සැප්තැම්බර් 30 දින භාණ්ඩාගාර ලේකම් විසින් සභාපතිත්වය දරන ලද රැස්වීමේදී ගන්නා ලද තීරණයට අනුව, නොගෙවූ ඉන්වොයිස් වටිනාකම (ණය කාලපරිච්ඡේදයෙන් බැහැරව) මත පොලී 2013 අප්‍රේල් 20 දින සිට බල පැවැත්වෙන පරිදි ගෙවීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද, රු.753,610,829 ක ප්‍රමාද පොලී ගෙවීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2013 අප්‍රේල් 20 දිනට පෙර ඉන්ධන මිලදී ගැනීම සඳහා අදාළ වේ. එබැවින්, මණ්ඩලය වගකිව යුතු නොවන බැවින් මෙම වෙනස සඳහා සැසඳීමක් සිදුකිරීම අවශ්‍ය නොවේ."

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට බිල් කිරීම් පද්ධතියේ දැක්වෙන තොග හා සාමාන්‍ය ණයගැති ශේෂයන් සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අතර එකතුව රු.423,369,454 ක නොසැසඳූ වෙනස්කම් නිරීක්ෂණය විය. බිල් කිරීම් පද්ධතියේ ඇතුළත් ඇතැම් අවසාන වෙළඳ ණයගැති ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ශේෂයන්හි ඇතුළත් කර නොතිබූ බවත්, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ඇතැම් අවසාන වෙළඳ ණයගැති ශේෂයන් බිල් කිරීම් පද්ධතියේ දැක්වෙන ණයගැති ශේෂයන්හි ඇතුළත් කර නොතිබූ බවත් නියැදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(ඇ) ලංකා කෝල් සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ශුද්ධ මුදල රු.143,351,210 ක් විය. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ලෙස දැක්වෙන අනුරූපී මුදල රු.1,435,642,785 ක් විය. එබැවින්, එම ගිණුම් 2 ක අතර රු.1,292,291,575 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) එල් ටී එල් හෝල්ඩින්ග්ස් සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත හෙළදනව් සමාගමට ගෙවිය යුතු ශේෂය රු.270,498,308 ක් විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල එය රු.330,071,158 ක් ලෙස දැක්වුණි. එබැවින්, එම මුදල් ශේෂයන් අතර රු.59,572,850 ක පැහැදිලි නොකරන ලද වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**--------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට රු.15,045,563,295 ක වෙළඳ ණයගැති ශේෂයෙන්, සාමාන්‍ය හා තොග සැපයුම් වලට අදාළව රු.3,196,567,076 ක්වූ ශේෂයක් වර්ෂයකට වැඩිකාලයක් හිඟ හිට පැවති අතර, ඉන් රු.1,770,191,480 ක් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ආ) ලංකා විදුලි සමාගමෙන් ලැබිය යුතු රු.46,548,248 ක මුදලක් කිසිදු අයකර ගැනීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව, වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. තවද, එකතුව රු.2,280,397,073 ක් වූ වෙනත් ලැබිය යුතු ශේෂ 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ණයගැතියාගේ නම | මුදල | විස්තරය |
|---|---|---|
| | රු. | |
| සීමාසහිත වුඩ් ගෲප් ගැස් ටර්බයින් | 8,264,352 | වෙස්ට් කෝස්ට් විදුලිබල පිරියත සඳහා ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා කරන ලද ගෙවීම්. |
| එවකට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 6,142,277 | කෙරවලපිටිය ඒකාබද්ධ විදුලිබල පිරියත විවෘත කිරීමේ උත්සවය සඳහා ගෙවීම්. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 897,025,999 | කුඩා විදුලිබල සංවර්ධකයින්ට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගාස්තු ගැලපීම, ගෙවීම. |
| සීමාසහිත ඒර්එස් කැළණිතිස්ස (පුද්ගලික) සමාගම | 1,368,964,445 | මිල වෙනස්කම් පිළිබඳ ගෙවීම් මත අයකරගත යුතු මුදල |
| එකතුව | 2,280,397,073 | |

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

### (අ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත

(i) 47(1)(ආ) වගන්තිය - ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබාගන්නා ලද ණය ආපසු ගෙවීමට අදාළව ලංකා විදුලිබල මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ නිදන් අරමුදලක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. මෙම අරමුදලේ ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එය 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 17,447 ක් විය.

(ii) 47(2)(අ) වගන්තිය - ලංකා විදුලිබල මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපලවල ක්ෂය ආවරණය කර ගැනීම සඳහා මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ ක්ෂය සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව, 2000 දෙසැම්බර් 31 දක්වා වාර්ෂිකව රු.මිලියන 1 ක් මාරු කිරීම මඟින් මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය සංචිතයක් ඇති කර තිබූ අතර, ඉන්පසු කිසිදු සංචලනයක් සිදු කර නොතිබුණි. එදිනට සමුච්චිතව පැවති රු.මිලියන 23 ක මුදලක් කිසිදු සමාලෝචනයකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(iii) 47 (2) (ආ) වගන්තිය - ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කර ගැනීම සඳහා හා මණ්ඩලය විසින් වරින්වර තීරණය කරනු ලබන වෙනත් එවැනි අරමුණු සඳහා මණ්ඩලයේ ආදායමෙන් ප්‍රාග්ධන වැඩ සඳහා මූල්‍යායනය කිරීමේ අරමුණින් මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ එක්ව පොදු සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ප්‍රාග්ධන සංචිතයක් ස්ථාපිත කර තිබූ නමුත් 2000 වර්ෂයේ සිට එය යාවත්කාලීන කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 165.45 ක් විය.

(iv) 46 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 කොටසේ II (අ) සහ (ආ) වගන්තිය - පනත්වල විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් 1989 වර්ෂයේ සිට එක් එක් වර්ෂය අවසානයේදී දළ ස්ථාවර වත්කම් මුළු වටිනාකමින් සියයට 0.1 ක දායකයක් ලෙස 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6,496 ක් වූ එහි අරමුදල් ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ආයෝජනය කර තිබුණි.

(ආ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තියේ දක්වා ඇති පරිදි ලංකා විදුලිබල මණ්ඩලය විසින් පාරිභෝගික තැන්පතු සඳහා පොලිය ගෙවා නොතිබුණු අතර 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද රේටය පදනම්ව විගණනය විසින් කරන ලද ගණනය කිරීම් අනුව ඒ සඳහා පොලිය රු.මිලියන 800 ක් විය.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රක්ෂණ සංචිත අරමුදලට අදාළව රු.මිලියන 5,635 ක මුදලක් ලංකා විදුලිබල මණ්ඩලයේ ස්වයං රක්ෂණ ප්‍රතිපත්තිය අනුව ආයෝජනය කර නොතිබුණි. තවද, එවැනි ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ විධිමත් මූල්‍ය කළමනාකරණයක් ක්‍රියාත්මක නොවීය.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ලංකා විදුලිබල මණ්ඩලයේ හා සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 13,234 ක හා රු.මිලියන 10,439 ක බදු පූර්ව ශුද්ධ පාඩුවක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය පිළිවෙලින් රු.මිලියන 19,409 ක් හා රු.මිලියන 23,943 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ පිළිවෙලින් රු.මිලියන 32,643 ක හා රු.මිලියන 34,382 ක පිරිහීමක් දැක්වුණි. සියයට 29 කින් ජල විදුලිබල උත්පාදනය අඩුවීම හේතුවෙන් සියයට 96 කින් හා සියයට 14 කින් පිළිවෙලින් තාප හා ගල් අඟුරු විදුලිබල උත්පාදනය වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වුවද, එකතුව රු.මිලියන 65,467 ක් වූ පෞද්ගලික පඩිනඩි, බදු වියදම හා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ අගය එකතු කිරීම රු.මිලියන 62,901 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 25,916 කින් හෙවත් සියයට 29 කින් අඩු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2016 දෙසැම්බර් 31 දිනට සමූහයේ කාරක ප්‍රාග්ධනය රු.මිලියන 16,031 ක් විය. කෙසේ වුවද, පෙර වර්ෂයේ එය රු. මිලියන 32,736 ක් වූ බැවින් පෙර වර්ෂයට සාපේක්ෂව එය සියයට 51 කින් පිරිහී තිබුණි. රු.මිලියන 32,616 කින් වෙළඳ ණයහිමියන් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන හේතුව විය.

### 3.2.2 ස්කන්ධයට ණය

සමාලෝචිත වර්ෂයේ ශුද්ධ පාඩුව හේතුවෙන් සමූහයේ ස්කන්ධය සියයට 4 කින් පෙර වර්ෂයට සාපේක්ෂව අඩු වී තිබුණි. තවද, 2016 දෙසැම්බර් 31 දිනට සමූහය විසින් යෙද වූ මුළු ප්‍රාග්ධනයෙන් සියයට 30 ක් හෙවත් රු.බිලියන 234.52 ක් ණයගැනීම් මඟින් මූල්‍යායනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වර්ෂයේ සියයට 0.48 සිට සමාලෝචිත වර්ෂයේ සියයට 0.51 දක්වා සමූහයේ ස්කන්ධයට ණය අනුපාතය වැඩි වී තිබුණි.

### 3.2.3 ලාභදායීත්වය

2015 වර්ෂයේ සාමාන්‍ය ඒකක පිරිවැය වූ රු.15.01 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය ඒකක පිරිවැය රු.18.06 ක් වූ අතර එක් ඒකකයක් රු.16.18 ක සාමාන්‍ය මිලකට විකුණා තිබුණි. (පෙර වර්ෂයේ සාමාන්‍ය විකුණුම් මිල ඒකකයකට රු.16.00 ක් විය.) ඒ අනුව සමාලෝචිත වර්ෂයේ එක් ඒකකයකින් දළ පාඩුව රු.1.88 ක් වූ අතර පෙර වර්ෂයේ එක් ඒකකයකට රු.0.99 ක් වූ සාමාන්‍ය දළ ලාභයට සාපේක්ෂව එය සියයට 298 ක අඩුවීමක් විය. ගාස්තු වර්ගය හා පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණූ විදුලිබල එක් ඒකකයකට දායකය (Kwh) පහත වගුවෙන් දැක්වේ.

| **වර්ගය** | **එක් ඒකකයකට දායකය (Kwh)** | |
|---|---|---|
| | **2016** | **2015** |
| | රු. | රු. |
| ගෘහස්ථ | (4.64) | (2.13) |
| ආගමික ස්ථාන | (10.91) | (7.88) |
| සාමාන්‍ය කාර්යය | 5.84 | 8.93 |
| කර්මාන්ත | (3.43) | 2.74 |
| රජය | 0.28 | (0.24) |
| හෝටල් | (0.32) | 3.32 |
| වීථි ආලෝකකරණය | (18.06) | (15.01) |
| ලංකා විදුලි (පුද්ගලික) සමාගමට විකුණුම් | (2.29) | 0.42 |
| දායකය | (1.88) | 0.95 |

ඒ අනුව, සාමාන්‍ය කාර්යය ගාස්තු වර්ගය හා රජය පමණක් සමාලෝචිත වර්ෂය සඳහා මුළු දායකයට ධනාත්මක දායකයන් විය. සමාලෝචිත වර්ෂයේ මුළු දායකයට වැඩිම ඍණාත්මක දායකය වූයේ

කර්මාන්ත හා ගෘහස්ථ වර්ගය මත ගාස්තු වර්ගයයි. එසේම ගෘහස්ථ, ආගමික, කර්මාන්ත, හෝටල්, ලංකා විදුලි සමාගම සඳහා විකුණුම් යන ගාස්තු වර්ගද ඒ සඳහා අහිතකර දායකයන් දක්වා තිබුණි.

### 3.3 අවිධිමත් ගනුදෙනු

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 දෙසැම්බර් 13 වැටුප් සංශෝධන අවස්ථාවේදී හා 2015 මැයි 20 දින සාමූහික ගිවිසුම සලකා බලන අවස්ථාවේදී උපයන විට ගෙවීම් බදු (PAYE) බැරකම සේවකයන්ට මාරු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් තීරණ ගෙන තිබුණි. කෙසේ වුවද අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ඉහත තීරණයන්ට පටහැනිව අදාළ සේවකයන්ගේ වැටුප්වලින් අයකර ගැනීමෙන් තොරව 2010 සිට 2016 කාලපරිච්ඡේදය තුළ රු.2,617,839,903 ක් වූ උපයන විට ගෙවීම් බදු ලංකා විදුලිබල මණ්ඩලය විසින් එහි අරමුදල්වලින් ගෙවා තිබුණි.
එක් එක් සේවකයාගේ උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී 2001 මැයි 20 දිනැති අංක 1706/18 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් දක්වා ඇති මුදල් නොවන ප්‍රතිලාභ වටිනාකම් සැලකිල්ලට ගත යුතුය. කෙසේ වුවද, නිල නිවාස, මහල් නිවාස හා පුද්ගලික භාවිතය සඳහා මෝටර් වාහන සැපයීම ආදිය වැනි මුදල් නොවන ප්‍රතිලාභ මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ආ) 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයට පටහැනිව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මණ්ඩලය විසින් එහි සේවකයන්ට විවිධ සේවක දීමනා වරින් වර ගෙවා තිබුණි. 2015 වර්ෂයේදී ගෙවන ලද එවැනි දීමනා රු.මිලියන 1,144 ට සාපේක්ෂව 2016 වර්ෂයේදී රු.මිලියන 1,222 ක් වූ එවැනි දීමනා ගෙවා තිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඇ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සියයට 10 සිට සියයට 14 දක්වා වූ පොලී අනුපාතයකට වාහන ණය ලබාදීම වෙනුවට, මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලී අනුපාතයකට මෙම වාහන ණය ලබා දී තිබුණි. තවද, ලංකා විදුලිබල මණ්ඩලය බරපතළ ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී තිබුණද, කිසිඳු පාලනයකින් තොරව සේවක ණය ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

### 3.4 හඳුනාගත් පාඩු

------------------

කාලීන ආකාරයෙන් අරමුදල් උපයෝජනය නොකිරීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ විදේශීය මූල්‍යයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී තිබූ ණය මුදල් වලින් 2016 වර්ෂයේදී බැඳීම් ගාස්තු ලෙස රු.59,750,592 ක මුදලක් ණය නියෝජිතායතනය විසින් අඩුකරගෙන තිබුණි.

### 3.5 මතභේදයට තුඩුදෙන කරුණු

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් වර්ෂ ගණනාවක් ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට විදුලි බලය විකිණීම හා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සිදුකර තිබුණද, එක් එක් ආයතනයේ සරල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා එම දෙපාර්ශවයන් සමඟ විකුණුම් හා ගැණුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ආ) ලක් විජය විදුලිබල පිරියත සඳහා 2016 වර්ෂය තුළ සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම විසින් ගල් අඟුරු ප්‍රසම්පාදනය කිරීමේදී හඳුනාගන්නා ලද ප්‍රධාන ගැටලුවලින් මණ්ඩලයට සිදු වී ඇති බලපෑම සාරාංශ කර පහත දැක්වේ.

(i) ගල් අඟුරු ප්‍රසම්පාදනය පිළිබඳ මුල් ලංසු ලියකියවිලිවල ඇතුළත් කෙටුම්පත් ගිවිසුම සමාගම ගල් අඟුරු සපයන්නන් සමඟ ගිවිසුම්වලට එළඹීමේදී සංශෝධනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රමාණ පිළිබඳ වෙනස්කම් සඳහා රු.461,453,005 ක් වූ මිල මඟින් වූ පාඩුව අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) ගල් අඟුරු බෑමේ වරායේදී නිකුත් කරන තත්ත්ව විශ්ලේෂණ වාර්තාව සැලකිල්ලට ගනු වෙනුවට පැටවීමේ වරායේදී නිකුත් කරන තත්ත්ව විශ්ලේෂණ වාර්තාව අනුව ගල් අඟුරු මිල ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සැපයුම්කරුවන්ගෙන් අයකළ හැකි රු.170,189,090 ක් වූ පාඩුව සමාගම විසින් දරා තිබුණි.

(iii) ගල් අඟුරු මෙට්‍රික් ටොන් 935,082 ක් ප්‍රසම්පාදනය කරන ලද නැව් බඩු තොග 16 කට අදාළ භාරගැනීමේ ලිපි නැංගුරමලන වරායට නැව් සේන්දු වීමට පෙර නිකුත් කර තිබුණි. එබැවින්, බෑමේ වරායෙන් ගල් අඟුරු විශ්ලේෂණ වාර්තා ලබාගැනීමට පෙර දීම සැපයුම්කරුට ගෙවීම් කර තිබුණි.

## 3.6 කළමනාකරණ කාර්යයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙහෙයුම් අත්පොත - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පළාත්) හා කලාප විදුලිබල අත්පොත ආදී සංශෝධිත අත්පොත් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී හඳුනාගත හැකිව තිබූ ඌන පරිපාථ තත්ත්වයන්ට විරුද්ධ නොවීම හේතුවෙන් 2005 වර්ෂයේදී රු.18,254,550 කට මිලදී ගෙන තිබූ වර්ෂ 35 ක ප්‍රයෝජනවත් ආර්ථික ජීව කාලයක් සහිත ට්‍රාන්ස්ෆෝමර් 2 ක් වර්ෂ 5-7 ඇතුළත ඉවත් කර තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකිරීම සඳහා කිසිඳු පියවරයක් ගෙන නොතිබුණි.

(ඇ) 2014 සැප්තැම්බර් 11 දින රු.7,221,707 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද ඉන්සියුලේටර් (Pin 33 KV) 3000 ක් තත්ත්වය පිළිබඳ ගැටලු හේතුවෙන් භාවිතා කර නොතිබූ අතර ඒවා ආදේශ කිරීමෙන් තොරව 2018 ජනවාරි 31 වන විටත් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. මේ සම්බන්ධයෙන් ලබාගත් කාර්යසාධන බැඳුම්කරයේ වලංගු කාලය 2016 පෙබරවාරි 26 දින ඉකුත් වී ඇති බවද තවදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) 2017 අප්‍රේල් 17 දිනෙන් අවසන් වූ උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේදී හඳුනාගන්නා ලද රු.52,550,929 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන ශාඛාව විසින් විශේෂ විමර්ශනයක් සිදුකර තිබුණි. කෙසේ වුවද, 2018 ජනවාරි 31 වන විටත් මෙම ඌනතාවය සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී ත්‍රිකුණාමලය, මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් (නඩු අංකය B/1164/15) ගොනු කර තිබුණි. කෙසේ වුවද, එම අධිකරණ නඩුව පිළිබඳ වර්තමාන තත්ත්වයට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) වටිනාකම රු.5,821,247 ක් වූ ආපදා ණය, ප්‍රවාහන ණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ආදී සේවක ණය කිසිඳු අයකිරීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ බඳවාගැනීම් හා උසස්වීම් පරිපාටිය (SOR) දීර්ඝ කාලයක් තුළදී යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) මානව සම්පත් අංශයේ ප්‍රධාන තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වන නමුත්, එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටියේ (SOR) දක්වා නොතිබුණු අතර එම තනතුර වෙනත් සේවාවලට විශේෂයෙන් විදුලි ඉංජිනේරුවරුන් සඳහා විවෘත කර තිබුණි.

(ඇ) පවත්නා බඳවා ගැනීම් පරිපාටියට අනුව, මානව සම්පත් නිලධාරීන්ගේ (HRO) මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 50 ක් බාහිරව පුරවන අතර එම ප්‍රතිශතය වර්ෂයෙන් වර්ෂයට සියයට 85 ක් දක්වා ක්‍රම ක්‍රමයෙන් වැඩිකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩල ඉතිහාසයේ දීර්ඝම කාලයක් ඉංජිනේරුවන් දෙදෙනෙකු විසින් අංශ ප්‍රධානී කාර්යයන් ආවරණය කරන බැවින් මෙම බාහිරව බඳවා ගන්නා සේවකයන්ට උසස්වීම් පරිපාටියේ පැහැදිලි උසස්වීම් මාර්ගයක් ඇති බව නිරීක්ෂණය නොවීය.

(ඈ) මානව සම්පත් කළමනාකරු (HRM) හා මානව සම්පත් නිලධාරී (HRO) සෘජුවම බඳවා ගැනීම සඳහා සේවකයන් 100 කට වැඩි ප්‍රමාණයක් සිටින ආයතනයක මානව සම්පත් ක්ෂේත්‍රයේ අවශ්‍යවන වර්ෂ 06 ක පළපුරුද්ද ලංකා විදුලිබල මණ්ඩලයේ කටයුතු කළ යුතු මුළු සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේදී ප්‍රමාණවත් නොවීය.

# 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### (අ) විදුලිබල උත්පාදනය හා සෘජු පිරිවැය

සමාලෝචිත වර්ෂය තුළ විදුලිබල උත්පාදනය සහ විදුලිබල මිලදී ගැනුම් සඳහා දරන ලද සෘජු පිරිවැය පිළිබඳ සාරාංශයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත වගුවලින් දැක්වේ.

### (i) විදුලිබල උත්පාදනය

| ප්‍රභවය | වර්ෂය තුළ විදුලිබල උත්පාදනය | | වැඩිවීම/ (අඩුවීම) | |
|---|---|---|---|---|
| | 2016 | 2015 | | |
| | ගිවොපැ | ගිවොපැ | ගිවොපැ | ප්‍රතිශතය |
| ජලවිදුලි | 4,220 | 5,969 | (1,749) | 29 |
| තාප | 4,461 | 2,275 | 2,186 | 96 |
| ගල් අඟුරු | 5,047 | 4,443 | 604 | 14 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති | 421 | 402 | 19 | 5 |
| එකතුව | 14,149 | 13,089 | 1,060 | 8 |

ඒ අනුව, දිවයිනේ පැවති නියඟය හේතුවෙන්, ජල විදුලිබල උත්පාදනය ගිවොපැ 1,749 කින් අඩුවීම නිසා 2016 වර්ෂයේදී ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගෙන් තාප විදුලිබල මිලදී ගැනීම සඳහා රු.මිලියන 22,682 ක සැලකිය යුතු මුදලක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් වැයකර තිබුණි.

ගල් අඟුරු විදුලිබල උත්පාදනය ගිවොපැ 604 කින් වැඩි වී තිබුණද, ගල් අඟුරු මිල පහත වැටීම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 437 කින් පිරිවැය අඩු වී තිබුණි.

**(ii) සෘජු පිරිවැය**

| විස්තරය | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | **රු. මිලියන** | **ප්‍රතිශතය** | **රු.මිලියන** | **ප්‍රතිශතය** |
| ඉන්ධන | 50,074 | 28 | 23,114 | 18 |
| **විදුලිබල මිලදී ගැනුම්** | 81,752 | 46 | 63,732 | 48 |
| ගල්අඟුරු | 20,204 | 11 | 20,641 | 16 |
| මෙහෙයුම් හා නඩත්තුව | 12,083 | 7 | 10,771 | 8 |
| **ක්ෂය** | 14,797 | 8 | 13,792 | 10 |
| සෘජු පිරිවැය | 178,910 | 100 | 132,050 | 100 |

ඉහත සඳහන් තොරතුරු අනුව, පෙර වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂය සඳහා විදුලිබලය මිලදී ගැනුම් හා උත්පාදනය පිළිබඳ සෘජු පිරිවැය රු.මිලියන 46,860 කින් හෙවත් සියයට 35 කින් වැඩි වී තිබුණු බව අනාවරණය විය. තවද, විදුලිබලය මිලදී ගැනුම් ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාරව විදුලිබල උත්පාදනයේ ස්ථාවර පිරිවැය නොවැළැක්විය හැකි බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයේ වඩාත් වැදගත් අරමුණුවලින් එක් අරමුණක් වන සාමාන්‍ය මහජනතාවට අඩු පිරිවැයට විදුලි බලය සැපයීම සාක්ෂාත් කරගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයට නොහැකි වන බවත් අනාවරණය විය.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සමාජ වගකීම්

ලක්විජය විදුලි බලාගාරයට අදාළ පාරිසරික ගැටලු සඳහා වන්දි මුදල් ලෙස ලංකා විදුලිබල මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.12,526,000 ක මුදලක් ගෙවා තිබුණි. තවද, පළාත් පාරිසරික ආරක්ෂණ අධිකාරිය විසින් 2017 ජුලි මාසයේ සිට පාරිසරික ආරක්ෂණ බලපත්‍රය (EPL) නිකුත් කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

ගිණුම්වල අයවැයගත හා තථ්‍ය විෂයයන් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ලංකා විදුලිබල මණ්ඩලයේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | | |
|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | i බෙදාහැරීම් අංශවල ප්‍රාග්ධන වැඩ නිමකිරීම් පිළිබඳ දිගු ප්‍රමාදයන් තිබීම.<br>ii දිවයින පුරා පැතිරුණු ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ඉඩම් මැනීම්, අගය කිරීම් හා ආරක්ෂා කිරීම් කඩිනම් කිරීම.<br>iii මෝටර් වාහන සඳහා යාවත්කාලීන කරන ලද දත්ත පදනමක් පවත්වා ගැනීම. |
| (ආ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | i ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු ශේෂ කාලීනව අයකර ගැනීම.<br>ii තොග සැපයුම් පිළිබඳ ඇප තැන්පතු කාලීන ආකාරයෙන් යාවත්කාලීන කිරීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කාර්යභාරය හා ප්‍රමාණය අනුව මානව සම්පත් කළමනාකරණය. |
| (ඈ) | ප්‍රසම්පාදනය | i පාලන උපකරණයක් ලෙස යොදාගැනීම සඳහා ප්‍රසම්පාදන සැලැස්ම තාත්විකව පිළියෙල කිරීම.<br>ii පාඩු අවම කරගැනීම හා ගල් අඟුරුවල තත්ත්වය පවත්වා ගැනීම සඳහා ගල් අඟුරු මිලදී ගැනුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. |
| (ඉ) | ඉන්වෙන්ට්‍රි පාලනය | i තොග වාර්තා විධිමත්ව පවත්වා ගැනීම.<br>ii තොග ඌනතාවය වළක්වා ගැනීම සඳහා ගල් අඟුරු තොග මෙහෙයුම් පිළිබඳ අදාළ පාලනයන් ස්ථාපිත කිරීම හා පවත්වා ගැනීම. |
| (ඊ) | ව්‍යාපෘති කළමනාකරණය හා පාලනය | i ව්‍යාපෘති කාර්යයන් සඳහා අභ්‍යන්තර විගණනය සිදුකිරීම.<br>ii ඉංජිනේරු ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කිරීම. |
| (උ) | ආයෝජන හා පරිපාලිතයන් පිළිබඳ පාලනය | ආයෝජන මත ප්‍රතිලාභ වැඩිකරගැනීම සඳහා මව් සමාගම විසින් එහි ආයෝජන පිළිබඳ පාලනයන් පවත්වා ගත යුතු වීම. |